"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

Chief Secretary — Telephone 2092599, Fax 2092601, Email chiefsecretary@wpc.gov.lk

My No. CSWP/FIN-AP/03/FI/10 Your No. Date 2018.11. 28

## මුල්‍ය චක්‍රලේඛ 05/2018(11)

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරීවල සභාපතිවරු (බ.ප.)

### සහනදායී පදනම මත මෝටර්රථ බලපත්‍ර ලබාදීමේ යෝජනා ක්‍රමය.

සහනදායී මෝටර්රථ බලපත්‍ර නිකුත් කිරීමට අදාලව මහා භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද 2018.02.15 දිනැති වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2018 හි 3.3 වගන්තිය සංශෝධනය කරමින් මහා භාණ්ඩාගාර ලේකම්ගේ 2018.09.11 දිනැති හා TIP/SS/01/03 දරණ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති අංක 01/2018(11) නිකුත් කර ඇත. (එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා එවමි.)

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/02/19/03/2018 හා 2018.11.19 දිනැති ලිපිය මගින් ඉහත සඳහන් චක්‍රලේඛය බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත. එහෙයින් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් හා පළාත්
භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත: 01.විගණකාධිපති.
02. බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු.
03.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
04.තොරතුරු තාක්ෂණ නිලධාරි.


| Deputy Chief Secretary | Administration | Personnel & Training | Finance | Planning | Engineering | Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel: 2092606 Fax: 2092605 dcsadmin@cs.wpc.gov.lk | Tel: 2092631 Fax: 2092647 dcspt@cs.wpc.gov.lk | Tel: 2092640 Fax:2092636 csfinance@wpc.gov.lk | Tel: 2092532 Fax:2092533 dsplancs@wpc.gov.lk | Tel: 2092501 Fax:2092505 dsengcs@wpc.gov.lk | Tel: 2092628 |

**මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**
**நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு**
**MINISTRY OF FINANCE AND MASS MEDIA**


මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: (+94)-11-2449823
කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் தளங்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: TIP/SS/01/03
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2018.09. 11

**වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ : 1/2018 (2)**

ජනාධිපති ලේකම්
අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩල ලේකම්
කොමිෂන් සභා ලේකම්වරුන්
අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්

**සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය**

සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීමට අදාළ අංක 01/2018 දරණ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 3.3 වගන්තිය, 2018.08.21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, පහත පරිදි මෙමගින් සංශෝධනය කරනු ලැබේ.

02. 3.3 වගන්තියෙහි පළමු ඡේදය අවසානයට මෙහි පහත සඳහන් වගන්තිය නව ඡේදයක් ලෙස ඇතුළත් කෙරේ.

> "මෙම චක්‍රලේඛයෙහි 1.9 කාණ්ඩයට අයත් ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ නිලධාරියෙකු, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 1/2016 හි 2.3.3 (අ) අනුව රජයේ අවශ්‍යතාවය මත, පත්වීම් බලධරයාගේ අනුමැතිය සහිතව මෙම චක්‍රලේඛයේ 1.12 හි සඳහන් රජයේ සංවර්ධන ව්‍යාපෘතියක, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත, ව්‍යාපෘති අධ්‍යක්ෂ, වරලත් ඉංජිනේරු, වරලත් ගණකාධිකාරී, වරලත් වාස්තු විද්‍යාඥ හෝ නීතිඥ තනතුරක (කොන්ත්‍රාත් පදනමින් හෝ) සේවය කර ඇත්නම් / සේවය කරන්නේ නම් සහ බලපත්‍රය ඉල්ලුම් කරන දිනය වන විට එම නිලධාරියා රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතනයක ස්ථිර සේවයෙන් අස්වී හෝ විශ්‍රාම ගෙන නොමැති නම්, එම නිලධාරියාගේ එකී සේවා කාලයද ඉහත සිය ස්ථිර තනතුරේ සේවා කාලය සමඟ එකතු කර අදාළ බලපත්‍රය සඳහා සේවා කාලය ගණනය කළ හැකිය. එවැනි ඉල්ලීම් අදාළ අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය සහිතව ඉහත ඡේදයේ දක්වා ඇති පරිදි කටයුතු කිරීමට වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය."

03. 2018.06.08 දිනැති අංක 01/2018 (i) දරණ චක්‍රලේඛයෙන් සංශෝධිත 2018.02.15 දිනැති අංක 01/2018 දරණ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ අනෙකුත් සියලු විධිවිධානයන් නොවෙනස්ව පවතී.

**ආර්.එච්.එස්. සමරතුංග**
මහා භාණ්ඩාගාරයේ ලේකම් හා
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්

| | |
|---|---|
| විගණකාධිපති | - අ.ක.ස. |
| මහ බැංකුවේ අධිපති | - අ.ක.ස. |
| අධ්‍යක්ෂ ජනරාල්, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | - ඉහත පරිදි කටයුතු කිරීම සඳහා |
| අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව | - අ.ක.ස. |
| අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගුව | - අ.ක.ස. |
| අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | - අ.ක.ස. |
| අධ්‍යක්ෂ ජනරාල්,රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව | - අ.ක.ස. |
| අධ්‍යක්ෂ ජනරාල්, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව | - අ.ක.ස. |
| කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | - අ.ක.ස. |
| අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව | - අ.ක.ස. |